# සමාජ ජාල හා නව සන්නිවේදන මාධ්‍ය නව යොවුන්වියේ දරුවන්ගේ සමාජ සම්බන්ධතා කෙරෙහි ඇති කරන බලපෑම.

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

*ජී.ඩී. බුද්ධිකා නුවන්ති අල්විස්* [1]

*කේ. කරුණාතිලක* [2]

සංක්ෂේපය

සන්නිවේදන තාක්ෂණයේ ලෝක ව්‍යාප්තිය හමුවේ ලොව එකට යා කිරීමට නව සන්නිවේදන මාධ්‍යයන්ට හැකියාව ලැබී ඇත. ක්ෂණික බව හා ඍජු ප්‍රතිපෝෂණය සහිතව පුද්ගල කේන්ද්‍රීයව නව මාධ්‍ය නිර්මාණය වී තිබේ. සංකීර්ණ වූ සමාජයක් තුළ පුද්ගල අවශ්‍යතාවන්ගේ ස්වරූපයන් ද විවිධ දිශානතීන් ඔස්සේ ව්‍යාප්ත වන අතර එම අවශ්‍යතා ව්‍යාකූලව පවතී. මෙම පසුබිම තුළ පුද්ගල සබඳතා පැවැත්වීම ද විපර්යාසයන්ට ලක්ව ඇත. සාම්ප්‍රදායික සමාජයේ මෙන් භෞතිකත්වය හා සබඳතා පැවැත්වීමට විශාල කාලයක් වෙන් කිරීමට, අන්‍යයන් වෙනුවෙන් කැපවීමට වත්මන් පුද්ගලයාට ලැබෙන ඉඩ සීමා සහිත වේ. අවිවේකීබව, හුදකලාබව යන රික්තකයන්ට විසඳුම් සෙවීමේදී සමාජ ජාල හා නව සන්නිවේදන මාධ්‍ය ප්‍රමුඛවේ. තරඟකාරී ආර්ථික හා අධ්‍යාපනික රටාවන් හමුවේ දෙමාපියන්ගෙන් ද, තම පවුලේ නෑදෑ හිතවතුන්ගෙන් ද අනෙකුත් සමාජ සබඳතාවන්ගෙන් ද දුරස් වන දරුවන් මෙවැනි නව සන්නිවේදන මාධ්‍යයන් කෙරෙහි වැඩි නැඹුරුවක් දක්වීම තුළ ඔවුන්ගේ තත්‍ය සමාජ සම්බන්ධතාවන් පවත්වාගෙන යාමේදී එය කෙලෙස බලපෑම්කාරී වේ දැයි ගැටලුවක්ව පවතී. මෙම තත්වය අධ්‍යයනය කිරීම උදෙසා සමාජ ජාල හා නව සන්නිවේදන මාධ්‍යයන් භාවිතයෙහි යෙදෙන නව යොවුන් වියේ දරුවන්ගේ සමාජ සම්බන්ධතාවන්ගේ ස්වරූපය හඳුනා ගැනීම මූලික පරමාර්ථය කර ගනිමින් කෘත්‍යාත්මක හා සමීක්ෂණ ක්‍රමවේදයන් ඔස්සේ පර්යේෂණය සිදු කළ අතර පර්යේෂණ ක්ෂේත්‍රය ලෙස මහනුවර ශාන්ත අන්තෝනි පිරිමි විද්‍යාලයත්, ශ්‍රී රාහුල මහා විද්‍යාලයත් තෝරා ගනිමින් නව යොවුන් වයසේ පසුවන්නන් 100 දෙනෙකු වූ නියැදිය ඇසුරින් මෙම අධ්‍යයනය සිදු කර ඇත. මේ යටතේ නව යෞවනයන්ගේ සමාජ සම්බන්ධතාවන්හී ස්වරූපය පිළිබඳවත්, නව යොවුන්වියේ දරුවන් සමාජ ජාල හා නව සන්නිවේදන මාධ්‍ය භාවිතය තුළ ඔවුන්ගේ සමාජ සම්බන්ධතාවන්ටවන සාධනීය හා නිශේධනීය තත්ව මෙන්ම නව යෞවනයන් නව සන්නිවේදන මාධ්‍ය කෙරෙහි යොමුවීමේ ප්‍රවණතාවන් පිළිබඳව ද තොරතුරු අධ්‍යයනය කර ඇත. දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලී ක්‍රමය යොදා ගත් අතර එසේ රැස් කරන ලද දත්ත°ෂී මෘදුකාංගය භාවිතයෙන් විශ්ලේෂණය කරන ලදී. නියදියට ලක් කළ සියලු දෙනාම අන්තර්ජාලය භාවිතා කරන්නන් වූ අතර අධ්‍යාපනික කටයුතු සඳහා වැඩි පිරිසක් අන්තර්ජාලය ප්‍රයෝජනවත් බව දක්වීය. එමෙන්ම නියදියෙන් 93% ක් සමාජ ජාල වෙබ් අඩවියක සාමාජිකයින් විය. ඒ අතර ෆේස්බුක් වෙබ් අඩවියේ ලියාපදිංචි වූවන් වැඩි ප්‍රතිශතයක් පෙන්නුම් කළ අතර එය 79% ක් විය. නව මිතුරන් හඳුනා ගැනීමටත්, මිතුරු සබඳතා පවත්වාගෙත යාමටත්, මිතුරු ජාල ගොඩනගා ගැනීමටත් වැඩි පිරිසක් ෆේස්බුක් භාවිතා කරන බව අනාවරණය විය. මෙහි සමාජ සබඳතා සඳහා වන නිශේධනීය කාරණාවන් අනාවරණය කර ගැනීමේ දී නියැදියට ලක් කළ පිරිසෙන් 37% ක ප්‍රමාණයක් විවේක කාලයේ දී සිදු කරනුයේ සමාජ ජාල වෙබ් අඩවි වෙත පිවිසීමයි. 25% ක් විවේකයෙන් සිටින කාලයේ දී පරිගණක ක්‍රීඩාවන්වල නියැලෙන අතර අවට මිතුරන් හා අසල්වැසියන් සමග කල් ගත කරනුයේ 5% ක් තරම් අවම ප්‍රමාණයකි. අනෙක් 31% ක්ද සිය විවේක කාලය ගත කරනුයේ සන්නිවේදන මාධ්‍යයක් භාවිත කරමිනි. ඔවුන් එදිනෙදා ජීවිතයේ තත්‍ය සමාජ සම්බන්ධතාවන් පවත්වාගැනීම කෙරෙහි යොමු වීමේ අඩු ප්‍රවණතාවක් මේ තුළින් අනාවරණය විය. අසල්වැසියන් සමග මධ්‍යස්ථ සබඳතාවක් පවත්වා ගැනීම 66% ක් වූ අතර 13% ක් දුරස් සබඳතාවක් පවතින බව දක්වීය. නියැදියෙන් 72% ක්ම දහම් අධ්‍යාපනය නොලබන්නන් විය. නියැදියෙන් 70% ක්ම පාසලෙන් පරිභාහිර වූ ළමා සමාජයක හෝ යොවුන් සමාජයක සාමාජිකත්වය නොලබන්නන් විය. මේ අනුව මෙම අධ්‍යයනයෙන් ලැබූ තොරතුරු මත සමාජ ජාල හා නව සන්නිවේදන මාධ්‍ය භාවිතය නව යොවුන් වියේ දරුවන්ගේ අධ්‍යාපනික කටයුතු වලටත්, නව මිතුරු සබඳතා ගොඩනගා ගැනීමටත්, අදහස් ආකල්ප හුවමාරු කර ගැනීමටත්, දුරස් වූ හිත මිතුරු සබඳතා සමීපව පවත්වාගෙන යාමටත් වැදගත් වන බව නිගමනය කළ හැකි වූ අතරම, වැඩි වශයෙන් අන්තර්ජාල භාවිතය හා සමාජ වෙබ් අඩවි වෙත පිවිසීම ඒ සඳහා වැඩි කාලයත් ගත කිරීම තුළ අධ්‍යාපනික කටයුතු වලට බාධාකාරීවනවා සේ ම ඔවුන්ගේ තත්‍ය සමාජ සම්බන්ධතාවන් පවත්වාගෙන යාම කෙරෙහි ද නිශේධනීය බලපෑමක් එල්ල කර ඇති බවට අවසාන වශයෙන් නිගමනය කළ හැකි විය.

*1.සමාජ විද්‍යාව, සමාජ විද්‍යා අධ්‍යයන අංශයල කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව,*

*2.මහාචාර්යල සමාජ විද්‍යා අධ්‍යයන අංශයල කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව,*